# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2301/57 – 2022 ඔක්තෝබර් මස 14 වැනි සිකුරාදා – 2022.10.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2019/07.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.09.27 දිනැති හා අංක 2142/89 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2019.09.19 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් පන්නිපිටිය, ඇරැව්වල, මාලිගාවත්ත පාර, අංක 671/11 හි පදිංචි උදය හේමේන්ද්‍ර සමරවීර මයා සහ කොළඹ 02, හුණුපිටිය වැව පාර, අංක 117/10 හි පිහිටි වොයිස් ඔෆ් ඒෂියා නෙට්වර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.09.07 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී

යොමු අංකය: IR/COM/02/2019/07.
නඩු අංකය: A/102/2019.

උදය හේමේන්ද්‍ර සමරවීර,
අංක 671/11,
මාලිගාවත්ත පාර,
ඇරැව්වල, පන්නිපිටිය,
පන්නිපිටිය.

*පළමු පාර්ශවය*

එදිරිව

වොයිස් ඔෆ් ඒෂියා නෙට්වර්ක් ප්‍රයිවට් ලිමිටඩ්,
අංක 117/10 හුනුපිටිය වැව පාර,
කොළඹ 02.

*දෙවැනි පාර්ශවය*

අතර පවත්නා කාර්මික ආරවුල

පෙනී සිටීම.

පළමු පාර්ශවය වෙනුවෙන් ඉල්ලුම්කරු උදය හේමේන්ද්‍ර සමරවීර මහතා නීතිඥ අනුරුද්ධ එස් ආරච්චිගේ මහතා සමග ද, ආයතනය වෙනුවෙන් මානව සම්පත් කළමණාකරු පාලන පී. කරුණාරත්න මහතා නීතිඥ සඳුන් සේනාධිපති මහතා සමග පෙනී සිටී.

බලතල පැවරීම.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අනපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වැනි වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල් බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ගාල්ල කොහොඹන් වත්ත, අංක 66/2 A, එච්.ආර්.එල් සුගතදාස වන මා පත්කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති, කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ වොයිස් ඔෆ් ඒෂියා නෙට්වර්ක් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ සේවය කරන ලද උදය හේමේන්ද්‍ර සමරවීර මහතාට 2017 ඔක්තෝබර් හා නොවැම්බර් මාසවලට අදාල දිරි දීමනාව, වාහන දීමනාව, ඉන්ධන දීමනාව හා දුරකතන දීමනා නොගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද,එසේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ.

දෙපක්ෂය වෙත ආරවුලට හේතු වී ඇති කරුණ සම්බන්ධව විස්තර ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇති අතර දෙපාර්ශවයම විස්තර ප්‍රකාශන ඉදිරිපත් කර ඇති අතර එම විස්තර නැවත දෙපාර්ශවය වෙත යැවීමෙන් පසු දෙපාර්ශවයම පිළිතුරු සපයා ඇත. ඒ අනුව 2020.02.18 වන දින ප.ව. 1 ට නඩුව විභාග කිරීම ආරම්භ කළෙමි.

මෙදින වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මහතාට පැමිණිය නොහැකි බැව් දන්වූ ආයතනයේ මානව සම්පත් කළමණාකාර මහතා දිනයක් ඉල්ලා සිටී. ඉල්ලුම්කාර පාර්ශවය විරුද්ධතාවයක් නොදක්වන බැවින් 2020.03.16 වන දින පස්වරු 2 ට නඩුව විභාග කරන බවත් සූදානම්ව පැමිණෙන ලෙස දෙපාර්ශවයට දන්වන ලදී.

මෙදින කොරෝනා තත්ත්වය නිසා නඩු විභාගය පැවැත්වීමට නොහැකි වූ බැවින් 2020.06.30 මධ්‍යාහ්න 12 නඩු විභාගය ආරම්භ කළෙමි.

දෙපාර්ශවය සිය නීතිඥ මහත්වරු සමඟ පෙනී සිටී. දෙපාර්ශවය අතර සමථයක් නොමැති බැවින් අදාල ආරවුලට පදනම් වී ඇති මාස දෙකක හිඟ මුදල ලැබීමට ඉල්ලුම්කරුට සුදුසුකම් තිබේ ද යන්න තහවුරු කරන ලෙස වගඋත්තරකාර ආයතනය කරන ලද පැහැදිලි කිරීම් මත ඉල්ලුම්කාර පාර්ශවයට නඩුව ආරම්භ කරන ලෙස උපදෙස් දුනිමි.

මූලික විස්තර ප්‍රකාශන හා නඩු විභාගයේ දී දෙපාර්ශවය ඉදිරිපත් කළ සාක්ෂි අනුව විසඳිය යුතු ප්‍රශ්න

1. ඉල්ලුම්කරුට මෙම දීමනාව දීමේ අරමුණ
2. වග උත්තරකාර පාර්ශවය මෙම දීමනාව ඉල්ලුම්කරුට නොගෙවීමට සාධාරණ හේතු තිබේ ද?

2020.06.30 දින මධ්‍යහන 12 ට නඩුව විභාග කිරීම ආරම්භ කළ අතර ඉල්ලුම්කරු සිය නීතිඥ මහතා මගින් කරුණු ඉදිරිපත් කරයි. ඉල්ලුම්කරු 2019.10.31 දින අධිකරණයේ නියෝග මත විස්තර ප්‍රකාශන ඉදිරිපත් කර ඇති අතර එයට ආයතනය විසින් එම විස්තර ප්‍රකාශන 2019.12.30 දින පිළිතුරු සපයා ඇත.

ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් 2017 මාර්තු මස වොයිස් ඔෆ් නෙට්වර්ක් සමාගම මෙහෙයවන සියත FM ආයතනයට අලෙවි ප්‍රධානි තනතුරට ආයතනය විසින් කරන ලද ඉල්ලීම් මත ලක්ෂ පහ හමාරක වැටුපකට බැඳුන බව කියා සිටියි. (පිටු අංක 50)

ප්‍ර : එතකොට මහත්තයා සියත ආයතනයට බැඳුනේ 2017 මාර්තු මාසයේ කියලා කිව්වොත් හරිද
පි : නිවරදියි.
ප්‍ර : තම කාලයේ මහත්තයාට මහත්තයා කොපමණ වැටුපකටද මෙම ආයතනයේ සේවයට බැඳුනේ
පි : ලක්ෂ 5 1/2 වැටුපකට

එහි වැටුප පිළිබඳ, පිටු අංක 52

ප්‍ර : මහත්තයාගේ වැටුප පිළිබඳ මේකේ සඳහන් වෙනව ද?
පි : මූලික වැටුප ලක්ෂ 1 1/2 ක් බව සඳහන් වෙනවා.

මෙම දීමනා පිළිබඳ පිටු අංක 53/54

ප්‍ර : එතකොට මහත්තයා කියන්නේ පැහැදිලි කිරීම කරන්න මෙම දීමනාව වෙනම මෙම පත්වීම් ලිපියට ඇමුණුම් වශයෙන් සඳහන් කරන්න හේතුව සඳහන් කරන්න මහත්තයා.
පි : මේ සම්බන්ධයෙන් ආයතනයක් එක්ක කිහිප විටක්ම කතා කළා. ඒක වෙනම ගෙවන්නේ ඇයි කියලා එහිදී එම ආයතනය සඳහන් කළේ එම ආයතනයට බදුවලින් නිදහස් වීමට ඒවාට අදාළ නැතිව වෙනම සේවකයින් වෙත ලබා දෙන බවයි.
ප්‍ර : එතකොට මහත්තයා මහත්තයාගේ සම්පූර්ණ වැටුප රු. 550,000.00 ක් කිව්වොත් හරිද?
පි : නිවරදියි.

වැටුප් ගෙවීමට පෙර තක්සේරු කිරීමක් කරනවා ද යන්න අධිකරණය විමසූ විට ඉල්ලුම්කරු ප්‍රකාශ කළේ මාස 10 ට ම එවැන්නක් නොකල බවයි.

2017.02.15 වන දින පත්වීම් ලිපියක් දුන් බවත් එය A1 ලෙස ලකුණු කර ඉදිරිපත් කරනු ලබයි. එහි මූලික වැටුප ලක්ෂ එකහමාරක් බව සඳහන් වූ බවද පත්වීම් ලිපිය සමඟ ඇමුණුමක් ඉදිරිපත් කළ බව ද එය A1b ලෙස ලකුණු කර ඉදිරිපත් කරයි. එහි ප්‍රපෝමන්ස් එලවුන්ස් ලක්ෂ දෙකහමාරක්, වාහන දීමනාව ලක්ෂයක් ද,ඉන්ධන දීමනාව පනස්දහසක් ද, දුරකතන දීමනාව පන්දාහක් ලෙස සඳහන් වන බව ප්‍රකාශ කරයි. පත්වීම් ලිපියට අමතර ඇමුනුමක් වශයෙන් සඳහන් කරන ලද හේතුව ලෙස බදුවලින් නිදහස් වීමට වෙනම ගෙවන බව ආයතනය පැහැදිලි කළ බව ද ඒ අනුව සම්පූර්ණ වැටුප රුපියල් **පන්ලක්ෂ පනස්දාහක්** බව ප්‍රකාශ කර සිටියි.

දිරි දීමනා ලබා දෙන විට දක්ෂතාවය, හැකියාව පිළිබඳ ඇගයීමක් කරනවා ද යන්න අධිකරණයෙන් විමසූ විට ඉල්ලුම්කරු ප්‍රකාශ කළේ මාස දහයටම එවැනි ඇගයීමක් නොකළ බවය. එම වැටුප එක් අවස්ථාවකදීත් දීමනාව තවත් අවස්ථාවකදීත් වශයෙන් අවස්ථා දෙකකදී තමාගේ සම්පත් බැංකු ගිණුමට බැර කරන බවයි. ඒ පිළිබඳ ලේඛන A2 සිට A9, A19, A20 දක්වා ලකුණු කර ඉදිරිපත් කර ඇත. මේ අනුව රු. එක්ලක්ෂ පනස්දාහ සැලරි ශීර්ෂය යටතේ ද තුන්ලක්ෂ අනූනවදහස් නවසිය හැත්තෑපහක් EMP අංකය යටතේ ගිණුම් ගත වීම තහවුරු කරයි. සම්පූර්ණ මුදල වන රු. 549975/- 2017 මාර්තු මස සිට 2017 සැප්තැම්බර් දක්වා ගිණුම් ගත කර ඇති බව සනාථ කරයි. යම් අඩු වීමක් නම් එය රජයේ නීති රීති අනුව අඩුවීමක් බව කියා සිටියි. ඉල්ලුම්කරු මෙම ක්ෂේත්‍රයේ අවුරුදු 22 ක පළපුරුද්දක් ඇති බවත් ඒ අනුව වසරකට ලක්ෂ දහයක් පහළොවත් අතර මුදලක් ලැබිය හැකි බවත් කියා සිටියි.

2017 ඔක්තෝබර් මස මූලික වැටුප ලැබුනු බවත් එම මාසයට අදාළ ඉතිරි කොටස නොලැබීම පිළිබඳව විමසීමක් ප්‍රධාන විධායක නිලධාරී මහතාගෙන් විමසූ විට මූල්‍ය මට්ටම පහළ වැටීම නිසා යම් කාල සීමාවක් ලබා දෙන්න කියූ බව ප්‍රකාශ කරයි. පිටු අංක 85-86

ප්‍ර : එතකොට මහත්තයාගේ ඔක්තෝබර් මාසයට අදාළ වැටුපේ සෙසු කොටස නොලැබීම සම්බන්ධයෙන් මහත්මයා ආයතනයෙන් විමසීමක් කලා ද?

පි : විමසීමක් කළා.
ප්‍ර : කාගෙන් ද විමසීමක් කළේ?
පි : ප්‍රධාන විධායක නිලධාරීතුමාගෙන්
ප්‍ර : එතුමන් මොකක්ද පැවසුවේ ?
පි : පෙර කී ආකාරයට ආයතනයේ මූල්‍ය මට්ටම පහළ වැටිලා නිසා ඒ අයට යම් කිසි කාල සීමාවක් ලබා දෙන්න කිවුවා මුදල් ගෙවන්න.

ඉල්ලුම්කරු ඉල්ලා සිටින්නේ 2017 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවල අදාළ දිරි දීමනා සහ අනෙකුත් නොගෙවීම් බවය. නොවැම්බර් මස වැටුප නොලැබීම නිසා කම්කරු දෙපාර්තුමේන්තුව අංක CS/COA/B/8/649/17 කළ පැමිණිල්ල මත රුපියල් 150000/- ක මුදලක් ලැබුණු බවත් ප්‍රකාශ කරයි.

ඉල්ලුම්කරු තම සේවා කාලයට අදාළව ආයතනයේ විකුණුම් වාර්තා A11 සිට A18 දක්වා ලේඛන ලකුණු කරමින් 2017 මාර්තු සිට නොවැම්බර් දක්වා සියත FM ආයතනයේ විකුණුම් වාර්තා ඉදිරිපත් කරයි. 2017 ප්‍රමාදය මත සේවයට වාර්තා නොකළ බව කියා සිටී.

පිටු අංක 130

වගඋත්තරකාර ආයතනයේ නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් 145 පිටු අංකය

ප්‍ර : කොහොමද ඔබ එය මෙම රැකියා අවස්ථා පිළිබඳව දැන ගත්තේ
පි : ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි අජාස් ෂයික් මහතා මා වෙත කථා කරලා මේ ටික භාරගන්න කියලා කිව්වා
ප්‍ර : ඒ කියන්නේ ඔබට ආයතනයේ ප්‍රධානියා විසින් කථා කරලා තමයි ආයතනයට එන්න කියලා කිව්වේ
පි : ඔව්

වැටුප පිළිබඳව 148 පිටු අංකය

ප්‍ර : සාක්ෂිකරු බලන්න මේකෙ මූලික වැටුප කියලා කොහේ හරි සඳහන් වෙනවාද? ඔබ දැන් සාක්ෂි ලබා දෙමින් සඳහන් කළ මූලික වැටුප කියලා තියනවාද?
පි : ආයතනය සඳහන් කළේ මේ ආයතනය බදු සහනවලින් මිදීම සඳහා මූලික වැටුප පමණක් මෙහි සඳහන් කර ඇමුණුම හරහා මගේ සියලුම දීමනාවන්ට අදාළව මා ඉල්ලූ මගේ වැටුප පන්ලක්ෂ පනස්දහසක වැටුප කොටස් දෙකක් වශයෙන් සපුරනවා කියලා.

පිටු අංක 152

ප්‍ර : පළමුවන දීමනාව ප්‍රෝමොන්ස් එලවන්සන්, ඒ කියන්නේ ඔබ දක්වන දක්ෂතාවයන් මත ඔබට ලැබෙන දීමනාවන් හරිද?
පි : එගොල්ලෝ විසින් සලසාගන්න ලේඛනයට අදාළව මගේ වැටුප ගෙවීමට හදා ගත්ත ෆැලට් ෆෝම් ඒ කියන්නේ මට ගෙවීමට අදාළ වන ලක්ෂ 5 1/2 ක මුදල කොටස් වශයෙන් පෙන්නුවා. ඒ ගෙවන්න යොදා ගත්ත වචන ටිකක් පමණයි.

157 පිටුව

ප්‍ර : සාක්ෂිකරු මම ඔබට යෝජනා කර සිටිනවා ඔබ මෙම A1b ලේඛනයේ කරුණු මේ A1 කියන සේවා ගිවිසුමේ ඇතුළත් වෙලා තියෙනවා කියලා කරන ප්‍රකාශය සම්පූර්ණ අසත්‍ය කියලා මම යෝජනා කරනවා.
පි : මෙම ලියකියවිල්ල A1 ලේඛනයේ අදාළ උපලේඛනය හැටියට ආයතනය මා වෙත මගේ දීමනාවන් සියල්ල වෙනම ලේඛනයට යොමු කර තහවුරු කර මා වෙත ලබා දුන්න ලියවිල්ලක්. එය ආයතනයේ මූල්‍ය අංශය විසින් ආදායම් බදුවලින් නිදහස් වීම සඳහා ලේඛන 2ක් ලෙස මා වෙත යොමු කරන බව ආයතන ප්‍රධාන විධායක නිලධාරිතුමා විසින් මා වෙත තහවුරු කළා සහ කිසිම දීමනාවක් කිසිම වේලාවක නොගෙවා ඉන්නේ නැත කියන පදනම මත සිට මගේ රැකියාව ගිවිස ගත්තා.

වග උත්තරකාර ආයතනය ඉල්ලුම්කරුට ලිඛිතව ඉලක්ක දී නැති බව පිටු අංක 160 හා 161

ප්‍ර : ඒ කියන්නේ ඔබගේ කණ්ඩායම විසින් ලබා දෙන කාර්ය සාධනය?
පි : මා ඇතුළුව මාගේ කණ්ඩායම විසින් ආයතනයට ලබා දෙන මාසික ආදායම, මේ වැටුපට අදාළ වෙන්නේ නැහැ කියලාත් ඒගොල්ලෝ සඳහන් කළා.
ප්‍ර : වැටුපට ඒක අදාළ වෙන්නේ නැහැ.

පි : වැටුපත් එක්ක ආයතනයේ ආදායම සංසන්ධනය නැහැ කියලා ඉන්කම් එකයි එලවන්ස් එකයි ඩිෆෙන්ඩ් වෙන්නේ නැහැ කියලා ආදායමයි දක්ෂතාවයයි සංසන්දනය වෙන්නේ නැහැ වැටුපට බලපෑමක් නොවන බව.

ප්‍ර : සාක්ෂිකරු ඒ අයිතමය යටතේ සඳහන්වන මේ කාර්ය සාධන දීමනාව ඒ කියන්නේ ප්‍රෆෝමන්ස් එලවන්ස් යනුවෙන් රුපියල් ලක්ෂ 2 1/2 ක මුදලක් සඳහන් වෙනවා එය ඔබ දූන් සඳහන් කළ පරිදි ඔබ විසින් ආයතනයට ලබා දෙන ආදයම ඔබ විසින් දක්වන දක්ෂතාවයන් පදනම් කරගෙන ගෙවන දීමනාවක් ද?

පි : දීමනාව ඔව්, එකී එලවන්ස් එක වෙනස් වෙන්නේ නැහැ. මෙය ලිඛිතව දී නැති බව

පිටු අංක 161

ප්‍ර : එතකොට සාක්ෂිකරු ඔබ දූන් එය සඳහන් කල පරිදි ඔබ ලබන ආදයම පිළිබඳ කිසිම සම්බන්ධයක් නැහැ කියලා කිව්වා නේද වැටුප අතර ඔබට ලබා දූන්න ආදයම මෙච්චරයි කියලා සඳහනක් කරල නැද්ද?

පි : නැහැ

ප්‍ර : කිසිම අවස්ථාවක දීලා නැද්ද?

පි : ලිඛිත ලියවිල්ලක් දීලා නැහැ.

2017 මාර්තු සිට සැප්තැම්බර් දක්වා ගෙවන ලද වැටුපට කාර්ය සාධනය බල නොපෑ බව ඉල්ලුම්කරුගේ නීතිඥ මහතාගේ නැවත ප්‍රශ්නවලට උත්තර දෙමින් ප්‍රකාශ කරයි.

වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මහතාගේ උපදෙස් මත ඒෂියා නෙට්වර්ක් පුද්ගලික සමාගමේ මූල්‍ය කලමනාකරුවන අමරනාත් ආරච්චිගේ දිනේෂ් මහතා සාක්ෂියට කැඳවා තිබුණි. උදය හේමේන්ද්‍ර මහතා මෙම ආයතනයේ අලෙවි ප්‍රධාන හැටියට සේවය කළ බවත් ඔහුගේ ප්‍රධාන රාජකාරිය වූයේ තම කණ්ඩායමට ලබා දෙන මාසික ඉලක්ක සපුරාලීම බවත් තම කණ්ඩායම මෙහෙයවමින් අවශ්‍ය උපදෙස් ලබා දී අවශ්‍ය නිර්නායකයන් සකස් කිරීම බව ප්‍රකාශ කරයි. ඉල්ලුම්කරුට A1 ලෙස සකස් කර ඇති පත්වීම් ලිපිය දී ඇති බවත් එහි ඔහු ඉල්ලුම් කරන මාසික වැටුප දූන් බවත් එය රු. 150,000/- ක් බව සඳහන් කර ඇති බවත් ප්‍රකාශ කරයි. ඉල්ලුම්කරුට අයිති වැටුප මෙහි සඳහන් කර ඇති බවත් මාසයක් තුළ ඔහුට අයිති වැටුප රු. 150,000/- ක් බවත් එය පත්වීම් ලිපියේ ඕල් ඉන්ක්ලුසිව් සැලරි ලෙස සඳහන් වන බවත් කියා සිටී. දෙන ලද පත්වීම් ලිපියේ ඔහුගේ කාර්යය සේවා ක්ෂේත්‍රය ඉදිරියේ දී දෙන බව සඳහන් කර තිබෙන බව ප්‍රකාශ කරයි.

"as well as any other duties assigned to you by the Management of the Company from time to time. A separate job Description detailing your duties and responsibilities of office will be issued to you upon commencement of employment (R1 ලිපියේ අවසාන ඡේදය)

ඉල්ලුම්කරු විසින් ලකුණු කර ඉදිරපත් කර ඇති A1b ලේඛනයේ memorandun යනුවෙන් සඳහන් වනුයේ කණ්ඩායම උපකරණ ඔවුන්ට පැවරුන රාජකාරිය ඔවුන්ට ලබා දෙන ඉලක්ක සපුරාගන්නේ නම් ඔවුන්ට මෙම අමතර දීමනා ලබාදෙන බවය. මෙම අමතර දීමනා ලබා දීම පිළිබඳව A1b ලෙස ලකුණු කර ඇති බවත් එය සේවා ගිවිසුමේ කොටසක් නොවන බව ප්‍රකාශ කරයි. එම දීමනා සෑම මසකම හිමිකම් කියන දෙයක් නොවන බවත් ලබා දී ඇති ඉලක්ක සම්පූර්ණ කරන්නේ නම් ආයතනය ලබා දෙන දීමනාවලට හිමිකම් කියන බව කියා සිටී. ඉලක්ක සපුරා ගන්නේ නැත්නම් නොදී සිටීමට කලමනාකාරිත්වයට හැකියාවක් තිබෙන බවද කියා සිටියි.

මේ අතර වගඋත්තරකාර ආයතනයේ නීතිඥ මහතා 2017.11.21 දිනැති ලිපියක් R1 ලෙස ලකුණු කර ඉදිරිපත් කරයි. ලිපිය ඡායා පිටපතක් බැවින් ඉල්ලුම්කාර පාර්ශවය විරෝධතා ප්‍රකාශ කරයි. ලිපියේ අඩංගු දෑ සහ අත්සන ඉල්ලුම්කරු පිළිගත් බැවින් සාක්ෂි මෙහෙයවීමට අවසර දුනි. R1 ලෙස ලකුණු කරන ලද ලිපිය මගින් ඉල්ලුම්කරුට අවවාදාත්මක ලිපියක් ලබා දුන් බවට පිළිගනී.

2017 නොවැම්බර් මාසයට නියමිත මිලියන 25 ඉලක්කය කරා ඉල්ලුම්කරු ඇතුළු කණ්ඩායම පසුගිය මාස 6 ඇතුළත ළඟා වී නොමැති බවත්, කාර්‍යක්ෂමතාවයක් නොමැති බවත් 2017 නොවැම්බර් මාසයට නියමිත මිලියන 25 ක ඉලක්කය ළඟා වී නොමැති බවත් ආයතනය බලාපොරොත්තුවන ඉලක්ක ලබා නොදුනහොත් දීමනා නැවැත්වීමටත් රැකියාව නතර කිරීමටත් සිදුවන බව එහි සඳහන් කර ඇත. ඉල්ලුම්කරු අත්සන් කරන ලද මුල් පිටපත් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දුනිමි.

වගඋත්තරකාර ආයතනය ඉල්ලුම්කරුගේ 2017 ඔක්තෝබර් නොවැම්බර් මාසවල පැමිණීමේ ලේඛන ඉදිරපත් කරයි. ඒ අනුව 2017 ඔක්තෝබර් මස දින 17 ක් ද නොවැම්බර් මස දින 7 ක් ද වැඩට පැමිණි බවට ලේඛන ඉදිරිපත් කරයි. මේ ගැන ඉල්ලුම්කරු සෑහීමකට පත් නොවේ. ආයතනයේ ආදයම අඩු වීම ඉල්ලුම්කරුගේ ක්‍රියාකාරිත්වය නිසා සිදුවූ බවට ආයතනය යෝජනා කර ඇත. ඉල්ලුම්කරු එය ප්‍රතික්ෂේප කරයි.

කාර්යාලයට පැමිණීම පිළිබඳව විද්‍යුත් සටහන් 2017 ඔක්තෝබර් නොවැම්බර් මාසවලට අදාළව ඉදිරපත් කරයි. 2017 ඔක්තෝබර් මස දින 21 ක් / 22 ක් පැමිණිය යුතු වුවත් ඔහු පැමිණ ඇත්තේ දින 17 ක් බවත් 2017 නොවැම්බර් දින 7 බවත් එය සනාථ කිරීමට ලේඛන ඉදිරිපත් කරයි. 2017 නොවැම්බර් මිලියන 25 ක ආදයම් ඉලක්ක සපුරා නොමැති බැවින් ඔහුට දෙන ලද

අවවාද ලිපිය R1 ලෙසද ලකුණු කරන ලද පත්වීම් ලිපියේ R6 ලෙස ලකුණු කර ඇති කොටසේ තිබෙන කොන්දේසි උල්ලංඝනය කිරීම මෙම අවවාද ලිපිය නිකුත් කළ බව ද කියා සිටියි. ඉල්ලුම්කරුට දෙන ලද පත්වීම් ලිපියට අදාළව දීමනා පිළිබඳව සනාථ කිරීම සඳහා ප්‍රියන්ති පෙරේරා යන අයගේ පත්වීම් ලිපිය ද පැමිණීම සහතික කිරීම සඳහා රතිකා මෙන්ඩිස් යන අයගේ පැමිණීම ද ඉදිරිපත් කරයි. ආයතනයේ සාක්ෂිකරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ ඉල්ලුම්කරු ඔක්තෝබර් නොවැම්බර් මාසවල පැමිණීම අසතුටුදායක බැවින් කාර්ය සාධනය වූ ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බවත් ඒ නිසා දීමනා නොගෙවූ බවත් ආයතනයේ සාක්ෂිකරු කියා සිටී.

වගඋත්තර ආයතනය සාක්ෂිකරු සාක්ෂි දෙමින් මෙම දීමනාව ලබා දීම පිළිබඳව පිටු අංක 245

ප්‍ර : සාක්ෂිකරු ගරු අධිකරණයට කියන්න මේ A1(b) ලේඛනයේ සඳහන් වෙන දීමනා ටික සෑම මසකම ඉල්ලුම්කරු විසින් හිමිකම් කියන දෙයක් ද?

පි : නැත. මේ A1(b) ලේඛනයේ සඳහන් වෙන දීමනා පෙර සඳහන් කළා වගේ ඔහුට පවරණ රාජකාරි ඉටු කරන්නේ නම් ඔහුට ලබා දී තිබෙන ඉලක්ක සම්පූර්ණ කරනවානම් ආයතනය විසින් ලබා දෙන දීමනාවක්. මෙම දීමනාව ආයතනයේ කළමනාකාරිත්වයට පුළුවන් ඔහු හොඳින් ම කරනවා නම් මේ දීමනා ලබා දෙන්න. මෙම දීමනාව වැඩිපුර වුණත් ලබා දෙන්න. ඒ වගේම තමයි ඔහුට පවරන රාජකාරි ඉලක්ක සම්පූර්ණ කරන්නේ නැත්නම් අපි කළමණාකාරිත්වය විසින් තීරණය කරනවා මේක නොදීමට කළමණාකාරිත්වයට පූර්ණ අයිතියක් තිබෙනවා.

පිටුව 246

ප්‍ර : එම A1(b) ලේඛනයේ සඳහන් වෙනවා අයිතම B යටතේ වාහන දීමනාව කියලා රු. 100000/- ක්. ඒ පිළිබඳව සඳහන් කරන්න සාක්ෂිකරු

පි : වාහන දීමනාව ලබා දෙන්නේ එම පුද්ගලයාට ඔහුගේ ඉලක්ක සපුරා ගැනීම සඳහා ඔහු ක්ෂේත්‍ර රාජකාරිවල නිරත විය යුතුය. ඔහුට හම්බවෙන පාරිභෝගිකයන් අපේ ආදායම් සපයන්නන් ඔවුන්ට ගිහිල්ලා ඒ අය සමග සාකච්ඡා පැවැත්වීම සඳහා එම දෙපාර්තමේන්තුවලට ලැබෙන එලවන්ස් එක්ක තමයි අපි වාහන දීමනාව ලෙස ඔවුන්ට ලබා දෙන්නේ.

වගඋත්තර ආයතනය ප්‍රකාශ කරන අරමුණ ගැන ඉල්ලුම්කරුට හා සිය කණ්ඩායමට අවබෝධයක් ලබා දී තිබේ ද? වග උත්තරකාර ආයතනයේ සාක්ෂිකරු සඳහන් කරනුයේ මේ පිළිබඳව ඉල්ලුම්කරුට වාචිකව ලිඛිතව සහ ඊ-මේල් මගින් දැනුම් දෙන බවත් මාසය මුල ඇගයීම් කර අදාළ මාසවල ඉලක්ක දැනුම් දෙන බවය. ආයතන ප්‍රධානී තක්සේරු කරන බවත් පවසයි.

පිටුව 350

ප්‍ර : ඔහුට සේවයට බැඳුණ දින සිට මාසිකව ලබා දෙන ඉලක්කය මොකක් ද?

පි : ඔහුට මාසික ඉලක්කය වශයෙන් මිලියන 25 ක ටාගට් එකක ඉලක්කයක් ලබා දීලා තියෙනවා.

නැවත ප්‍රශ්න විමසීමේ දී,

ප්‍ර : එසේ නම් තමා ඒ ගැන දැනුවත් වෙන්න අවශ්‍යයි නේද?

පි : එම ඉලක්ක මාසිකව වෙනස්වන නිසා මට මේ වෙලාවේ ඒක මතක නැහැ.

ප්‍ර : මේ ඉල්ලුම්කරුට වෙන වෙනම මාසික ඉලක්ක ලබා දී තිබුණා නම් ඒ ඉලක්ක සම්පූර්ණ කළාද නැද්ද කියලා දැන ගන්න තමා අඩු තරමේ මාසික ඉලක්ක ගැනවත් දැනගෙන ඉන්න ඕන නේ ද?

පි : මේක 2017 වර්ෂයේ සිදු වූ දෙයක් දැන් අවුරුදු පහකට ළඟයි මාසිකව අපි ඉලක්ක ලබා දෙනවා. නමුත් මේ වෙලාවේ මට මතක නැහැ.

ප්‍ර : එම ඉලක්ක තක්සේරු කිරීම සිදු කරන්නේ ආයතනයේ කවුරුන් විසින් ද?

පි : ප්‍රධාන විධායක නිලධාරි

දෙපාර්ශවයේ විස්තර ප්‍රකාශන හා ප්‍රති උත්තර සහ නඩු විභාගයේ දී දෙන ලද සාක්ෂි හා ලිඛිත දේශන අනුව මෙම දීමනාව ලබා දීමේ අරමුණු කුමක් ද යන්න විමසිය යුතුය.

ඉල්ලුම්කරුට 2017.02.15 දින දෙන ලද A1 ලෙස ලකුණු කර ඇති පත්වීම් ලිපිය හා A1b ලෙස ලකුණු කර ඇති මෙමරන්ඩල් නමින් දෙන ලද ඇමුණුමේ සඳහන් දීමනා සේවකයෙකුට ලබා දීමේ අරමුණ කුමක් ද යන්න මෙම තොරතුරු මගින් විශ්ලේෂණය කල යුතුය. මෙම දීමනාව,

1. Performance Allowance LKR. 250000.00
2. Vehicle Allowance LKR. 100000.00

| | | | |
|---|---|---|---|
| 3. | Fuel Allowance | LKR. | 50000.00 |
| 4. | Telephone | LKR. | 5000.00 |

මෙම දීමනාව ලබා දෙන්නේ ආයතනය ලබාදෙන ආදායම මත බව වගඋත්තරකාර ආයතනය ප්‍රකාශ කළ ද එය තහවුරු කිරීමට ලේඛන ඉදිරිපත් නොවේ.

ඉල්ලුම්කරු රු. ලක්ෂ 5 1/2 වැටුපකට අලෙවි ප්‍රධානි තනතුරට පත්වූ බව ප්‍රකාශ කර ඇත. තම වැටුප කොටස් වශයෙන් වෙන කර දෙන හේතුව විමසූ අවස්ථාවේ කාර්ය සාධන මත එනම්, ආයතනය ලබා දෙන ආදායම මත රුදෙන බව ආයතන ප්‍රධානි ඉල්ලුම්කරු දැනුවත් කර නැත. 2017 මාර්තු සිට 2017 සැප්තැම්බර් දක්වා මෙම දීමනාව ගෙවා ඇති අතර ඉලක්ක ගැන ඇගයීම් කර නැත. මෙම දීමනා පිළිබඳ අරමුණ කුමක්ද යන්න විමසීමේදී ඉල්ලුම්කරුගේ නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්නවලට ආයතනයේ සාක්ෂිකරු දුන් පිළිතුරු බැලිය යුතුය.

පිටු අංක 395

ප්‍ර : එතකොට ඔහු ඉන්ධන සඳහා රු. 50,000.00 ක් දුරකතන සඳහා රු. 5000.00 හා වාහන දීමනා සඳහා රු. 100,000.00 මුදලක් ඔහු සෑම මසකම කැප කිරීමක් කරලා නේද ආයතනයේ කාර්යය සාධනය කළ යුත්තේ ?

පි : නැහැ. ඒක අපි ලබා දෙන දිරි දීමනාවක් පමණයි.

ප්‍ර : එසේනම් ඒවා ඉන්ධන දීමනා දුරකතන දීමනා හා වාහන දීමනා ලෙස සඳහන් කර තිබෙන්නේ ඇයි?

පි : ඒක ඔහුට ලබාදෙන විට වෙන වෙනම වර්ග කරලා තිබෙනවා

(නොලැබීමට හේතු)

එමෙන්ම ඉල්ලුම්කරු තමාගේ ඔක්තෝබර් මස මුදල නොලැබුනු විට ආයතන ප්‍රධානි විධායක නිලධාරි මහතා හමුවී ඇත. එහි දී ඔහු ප්‍රකාශ කර ඇත්තේ

පිටු අංක 104

ප්‍ර : දූන් මහත්තයා ඒ ගැන ආයතනයෙන් විමසීමක් කළාද?

පි : විමසීමක් කළා

ප්‍ර : එතකොට ආයතනයේ කාගෙන්ද විමසීම කළේ ?

පි : ප්‍රධාන විධායක නිලධාරිතුමාගෙන්

ප්‍ර : එතුමා ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අදහස මොකද්ද?

පි : ආයතනයේ මූල්‍යමය පසුබිම දුර්වලතාවයක් තිබීම හේතුවෙන් වැටුප් ගෙවීම ප්‍රමාද වෙනවා කියලා කිව්වා

පිටු අංක 85

ප්‍ර : එතකොට මහත්තයාගේ ඔක්තෝබර් මාසයට අදාළ වැටුපේ සෙසු කොටස නොලැබීම සම්බන්ධයෙන් මහත්තයා විමසීමක් කළාද?

පි : විමසීමක් කළා.

මෙම විමසීමේදී ආයතනයේ අරමුණ ඉටු නොවූ හෙයින් දීමනා නොගෙවූ බව විධායක නිලධාරි ප්‍රකාශ කර නැත. ඉල්ලුම්කරුගේ මෙම ප්‍රකාශ පිළිබඳව වගඋත්තරකාර ආයතනය කිසිම හබකිරීමක් කර නැත. ඉල්ලුම්කරුගේ ප්‍රකාශයට අනුව මෙම දීමනාව ආයතනයේ යම් යම් අවශ්‍යතා මත වෙන් කිරීමක් බව පැහැදිලි වේ. මෙහිදී ඉල්ලුම්කරු මෙම ආයතනයේ රැකියාවට ඒමට පෙර මහාරාජා සංවිධානයේ සේවය කළ බවත් එහිදී ද ඔහුට රු. 350,000 වැටුපක් ලැබී ඇත.

මෙය සනාථ කිරීමට X2 ලේඛනයේ ඉදිරිපත් කරයි. 293 පිටුව

රු. 350,000/- වැටුපක් ලැබූ අයෙක් රු. 150,000/- වැටුපක් ගිවිස ගනීද යන්න අවධානය ලක්කල යුතුය. වග උත්තරකාර ආයතනයේ සාක්ෂිකරුගේ

''395 පිටුවේ ඒක ඔහුට ලබා දෙන විට වෙන වෙනම වර්ග කරල තිබෙනවා''

වගඋත්තරකාර ආයතනයේ නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි අජාස් ෂයික් මහතා කතා කරල රැකියාව බාරගන්න කියලා කියූ බව ප්‍රකාශ කරයි.

ඉල්ලුම්කරුට ගෙවන ලද වැටුප පිළිබඳ වගඋත්තරකාර නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් මෙම ආයතනයේ බදු සහනවලින් මිදීම සඳහා මූලික වැටුප පමණක් මෙහි සඳහන් කර ඇමුණුම හරහා සියලු දීමනාවලට අදාල මා ඉල්ලූ මගේ වැටුප රු. 550,000/- කොටස් දෙකක් වශයෙන් සපුරන බව ප්‍රකාශ කළ බව කියා සිටියි. තවදුරටත් නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්නවලට උත්තර දෙමින්

පිටු අංක - 153

ප්‍ර : එහෙනම් ඒ දීමනාව මොනවාද?
පි : ඒ දීමනාවන් මගේ මූලික වැටුපට සම්පූර්ණ මුදල කොටස් වශයෙන් කඩල ඒගොල්ලෝ, ඒ දීමනාවන් එකතු කරා මගේ වැටුපට
ප්‍රෆෝමන්ස් ගැන කිසිම සඳහනක් වුනේ නෑ ඉන්ටර්විව් එකේ. ඒක ඒගොල්ලො ආයතනික මට්ටමෙන් කොටස් වශයෙන් ගෙවන්න හදාගත්ත වචනයක්.

පත්වීම් ලිපියට අමතරව A1b ලෙස ලකුණු කර ඇති මෙමරන්ඩම් ලෙස දී ඇති ලිපියේ දීමනා ගැන පැහැදිලි කර ඇත. මෙම දීමනා රැකියාවට සම්බන්ධ කිසිම බලපෑමක් නැති බව ද කියා සිටියි. තමාට මෙපමණ මුදලක් ආයතනයට ලබා දිය යුතු යැයි කිසිම අවස්ථාවක සඳහන් කර නැති බව ඉල්ලුම්කරු හරස් ප්‍රශ්නවලට උත්තර දෙමින් ප්‍රකාශ කර ඇත.

මෙයින් පැහැදිලි වනුයේ කාර්ය සාධන වර්ධනය කිරීමේ අරමුණින් තොරව දෙන ලද දීමනාවක් බවය.

එමෙන්ම වගඋත්තරකාර ආයතනය එම වැටුපෙන් සේවක අර්ථසාධක අරමුදල් හෝ උපයන විට ගෙවිය යුතු බදු අඩු නොකර රු. 150,000/- වැටුප බැංකුගත කිරීමෙන් පැහැදිලි වනුයේ වැටුප් ගෙවීම නීත්‍යානුකූලව කර නොමැති බවයි. නිවාඩු අනුමත නොකර නොපැමිණි දින සඳහා වැටුප් අඩුකර නැත. වගඋත්තර ආයතනය මගින් ඉදිරිපත් කර ඇති රතිකා මෙන්ඩිස් නැමැති සේවිකාවියගේ පත්වීම් ලිපියේ දී මෙම දීමනාවන් වෙන් කර වර්ග කර ඇත. නමුත් ඉලක්ක හෝ කොන්දේසි සටහන් කර නැත. සමස්ථ සාක්ෂි විමසීමේදී A1(b) ඇමුණුමේ සඳහන් දීමනාවන් කාර්ය සාධනය මත දෙන ලද දීමනාවක් නොව ආයතනයේ අවශ්‍යතා මත දෙන ලද දීමනාවක් බව පැහැදිලි වේ.

මීළඟට විසඳිය යුතු ප්‍රශ්නය වනුයේ මෙම දීමනාව නොගෙවීමට හේතු මොනවා ද යන්නයි.

මෙම ඉල්ලුම්කරුට A1(b) ලේඛනයේ සඳහන් දීමනා 2017 ඔක්තෝබර් හා නොවැම්බර් මාසවලට අදාලව නොදීමට හේතුව 2019.10.28 දිනැතිව උත්තර ප්‍රකාශයේ සඳහන් වනුයේ (A21(a))

''මෙම නිලධාරියාට 2017 ඔක්තෝබර් හා නොවැම්බර් මාසවල මූලික වැටුප් ගෙවා ඇති අතර, කාර්යය සාධනය ඉතාමත් අසතුටු තත්ත්වයක පැවතීම හා ආදායම් ඉලක්ක අවම වශයෙන් හෝ සම්පූර්ණ නොකිරීමේ හේතුව මත එම මාස දෙකෙහි වැටුපට අමතර දීමනා ගෙවා නොමැති බව කාරුණිකව දන්වමි.''

වග උත්තරකාර ආයතනයේ මූල්‍ය කළමණාකරු සාක්ෂි දෙමින් පිටුව 252

ප්‍ර : සාක්ෂිකරු ගරු අධිකරණයට පැහැදිලි කරන්න 2017 ඔක්තෝබර් මාසයට අදාළව සහ 2017 නොවැම්බර් මාසයට අදාලව ඉල්ලුම්කරුට මෙම දීමනාවන් ලබා නොදීමට හේතු වුනු කරුණු මොනවාද කියලා
පි : මෙම මාස 2 තුළ මොහුට ආයතනය විසින් ලබා දුන්න ඉලක්ක මොහු විසින් සම්පූර්ණ කර තිබුණේ නෑ. ඒ වගේම මේ මාස 2 තුළ මොහුගේ කාර්යාලයට වාර්තා කිරීම නිසි පරිදි වෙලා නෑ.

නමුත් ඉල්ලුම්කරු තමාට මුදල් නොලැබීම පිළිබඳව ආයතන ප්‍රධානි විධායක නිලධාරී හමු වූ විට ඔහු ප්‍රකාශ කර ඇත්තේ,

ප්‍ර : ඒ කියන්නේ මහත්මයාට ඒ මාසයට අදාළ දීමනා හෝ ප්‍රවාහන දීමනා හෝ වෙනත් යම් මහත්මයාගේ පත්වීම් ලිපියේ සඳහන් වන මූලික වැටුපට අමතරව දීමනා ලැබීමක් සිදු කලාද?
පි : නැහැ
ප්‍ර : ඒ සම්බන්ධයෙන් මහත්මයා වගඋත්තරකාර ආයතනයේ විමසීමක් කලා ද?
පි : ඔව්
ප්‍ර : ඒ සම්බන්ධයෙන් වගඋත්තරකාර ආයතනය මොනක්ද කිව්වේ
පි : වර්තමානයේ තියෙන මුදල් අපහසුතා මත ඒකට යම් කාල සීමාවක් අවශ්‍යයි කියලා.

වගඋත්තරකාර ආයතනය ප්‍රකාශ කරන පරිදි නිසි පරිදි සේවයට වාර්තා කර තිබේද විමසිය යුතුය. වගඋත්තරකාර ආයතනයේ සාක්ෂිකරු ඉල්ලුම්කරුට අදාලව 2017 ඔක්තෝබර් හා නොවැම්බර් මාසවලට අදාලව පැමිණීම් ලේඛන R2, R3 ලෙස ලකුණු කර ඉදිරිපත් කරමින් පැමිණීමේ දුර්වලතා ඇති බව පෙන්වීමට උත්සාහ කර ගෙන ඇත. පිටු අංක 253

ප්‍ර : එතකොට 2017 ඔක්තෝබර් මාසයට අදලව කොපමණ කාලයක් ද ඉල්ලුම්කරු සේවයට පැමිණ තිබෙන්නේ ?
පි : ඔක්තෝබර් මාසය සඳහා දවස් 17 ක් පමණයි මොහු වාර්තා කර තිබෙන්නේ රැකියාවට
ප්‍ර : 2017 නොවැම්බර් මාසයට අදලව කොපමණ කාලයක් ද ඉල්ලුම්කරු සේවයට පැමිණිලා තිබෙන්නේ ?
පි : දවස් 7 ක් පමණයි.

මොහුගේ පැමිණීම සැසඳීම සඳහා ප්‍රියන්ති පෙරේරා නැමැති අයගේ ඇඟිලි සළකුණු යන්ත්‍රයෙන් ලබා ගත් පැමිණීමේ ලේඛණය ඉදිරිපත් කර ඇත. පිටු අංක 380

ප්‍රියන්ති පෙරේරා පුස්තකාල සේවිකාවකි. ඉල්ලුම්කරු ක්ෂේත්‍ර නිළධාරියෙකි. ක්ෂේත්‍ර නිලධාරියෙක්ගේ පැමිණීම පුස්තකාල සේවිකාවකගේ පැමිණීම සමග සැසඳීම අයුක්ති සහගතය.

ඉල්ලුම්කරුගේ පැමිණීම් ලේඛනවල 2017 ඔක්තෝබර් පැමිණීම සතියේ දින තුනක් හෝ හතරක් බවද, පිටවීම පමණක් සඳහන් වී ඇති බව පෙනේ. ක්ෂේත්‍ර නිලධාරියෙකු දිනපතා සේවයට වාර්තාකර පිටවිය යුතුයැයි උපදෙස් දී ඇති බවට සාක්ෂි ලබා දුන්න ද ලිඛිතව තහවුරු කර නැත.

2017 ඔක්තෝබර් මස පැමිණීම දින 17 ක් බව ඇඟිලි සලකුණු ලේඛනය අනුව තහවුරු වී ඇති අතර දින කීපයක් අසනීම නිවාඩු ගත් බවද ඒ සඳහා වෛද්‍ය සහතික ඉදිරිපත් කර නිවාඩු ලබා ගත් බවද ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත.

නිවාඩු පිළිබඳ ලිඛිත ලේඛන තබා ගන්නා බව (පිටු අංක 347) ආයතනයේ සාක්ෂිකරු පිළිගෙන ඇතත් සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කර නැත.

2017 සැප්තැම්බර් මසට අදල පැමිණීම ලේඛන අධිකරණයට ඉදිරපත් කරන ලෙස අධිකරණය නියෝග කලද එයට පිළිතුරු සපයා නැත. පිටු අංක 287
මේ සම්බන්ධව වගඋත්තරකාර ආයතනයේ ඉල්ලුම්කරුගේ නීතිඥ මහතා හරස් ප්‍රශ්නවලදී විමසීම් කර ඇත.
පිටු අංක 327

ප්‍ර : දැන් ගරු අධිකරණය විසින් මීට පෙර අවස්ථාවේදී R2 ලකුණු කරන ලද අවස්ථාවේ දී මෙම පැමිණිලිකරුගේ මීට පෙර අවස්ථාවක පැමිණීමේ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස දන්වා සිටියා නේද?
පි : එසේය ස්වාමිනි
ප්‍ර : අද දින එම ලේඛනය ගරු අධිකරණයට ඉදිරිපත් කළා ද?
පි : නැත ස්වාමිනි. මේක සොෆ්ට් වෙයාර් සිස්ටම් එකක් ස්වාමිණි. මෙහි දත්ත තියෙන්නේ අවුරුදු 2 කට පමණයි. අවුරුදු 2 කින් පස්සේ මේ දත්ත ස්වයංක්‍රීයව එම දත්ත නැති වෙලා යනවා. එහි තියෙන කැපැසිටි ඒක නිසා මේ පරණ ඩීටේල් ලබා ගන්න බෑ. මොකද ඒ ඩීටේල් දැනටම සිස්ටම් එකෙන් ඉවත් වෙලා තියෙන්නේ.

පැමිණීම නිසි පරිදි සිදුවෙලා නැත යන චෝදනාව ඉදිරපත් කිරීමට පෙර ඒ පිළිබඳ පූර්ව සේවා කාලය තුළ පැමිණීම පිළිබඳ තොරතුරු ලබා ගෙන ඒ අනුව නිගමනයක් කල යුතුය. එවැන්නක් සිදු වී නොමැත.

1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල පනත යටතේ අමාත්‍යවරයාට පැවරී ඇති බලතල යටතේ නිකුත් කර ඇති නියෝග අංක 45 අනුව 17 (1,1) වගන්ති හැරෙන්නට අනෙකුත් සෑම ලේඛනයක්ම වාර්තාවක් ම සේවායෝජක විසින් අවුරුදු 4 ක කාලයක් ආරක්ෂා කරගත යුතු බව දක්වේ යන නීතිය පවා උල්ලංඝනය කර ඇති බව ඉහත ප්‍රකාශයෙන් හෙලිවේ. අධිකරණය විසින් නියෝග කළ පැමිණීමේ ලේඛනය අදල වනුයේ, 2017.11 මාසයට වන අතර නියෝගය ලබා දුන්නේ 2021.06.30 වේ. අවම වශයෙන් මෙම ලේඛණ 2021.11 මස දක්වා වත් තබා ගැනීමට නීතියෙන් බැඳී ඇත.

සාක්ෂිකරු ප්‍රකාශ කරනුයේ මාසිකව වාර්ථා තමාට ලැබෙන බවය. පිටු අංක 309 හා 310

ප්‍ර : මහත්තයාට ඒ අංශයේ මැදිහත්වීමක් නැතිනම් මහත්තයාට ඒ අංශයේ ගන්න තීන්දු තීරණ සම්බන්ධයෙන් හෝ මහත්තයාට අවබෝධයක් නැහැ නේද?
පි : අවබෝධයක් නැහැ කියන්න බැහැ. මට ඒ අවශ්‍ය තොරතුරු මට ලබා දෙනවා.
ප්‍ර : දැන් මේ නඩු ඉල්ලුම්කරුගේ සේවයට බැඳුනු විටත් මේ කියන තොරතුරු ඔබට ලැබුණාද?
පි : එසේයි ස්වාමිනි.
ප්‍ර : ඒ තොරතුරු ලැබුණේ ලේඛන මගින්ද එමෙත් නැත්නම් ඊ-මේල් පණිවිඩ මගින් ද කොහොමද?
පි : ලේඛන මගින් ලබා දීලා තියෙනවා
ප්‍ර : එහෙම තොරතුරු ලැබුණාම අදල සේවකයාගේ සේවා ගිවිසුම සම්බන්ධව ඒ ලැබෙන ලේඛන මත පමණයි සාක්ෂි දිය හැක්කේ
පි : එසේය ස්වාමිනි.

2017 මාර්තු සිට 2017 සැප්තැම්බර් දක්වා සියලු දීමනා සහිතව රු. 549975/- මුදලක් මාසිකව එක් වරක හෝ දෙවරකදී ඉල්ලුම්කරුගේ ගිණුමට බැර කර ඇත. මේ කිසිම අවස්ථාවක කාර්ය සාධනය හෝ පැමිණීම පිළිබඳ ඇගයීමක් කර නැත. 2017 අප්‍රේල් මස ආදයම මිලියන 13.5 ක් වූ අතර ජුනි මස එය 10.9 දක්වා පහත වැටී ඇත. නමුත් මේ පිළිබඳ කිසි ඇගයීමක් හෝ උපදෙසක් හෝ විමසීමක් කළ බවට තහවුරු කර නැත. 2017 ඔක්තෝබර් සහ නොවැම්බර් මාස වලද පිළිවෙලින් 90.5 ක් ද 11.6 ක්ද ආදයම් ලැබූ බව ඉල්ලුම්කරු A10 සිට A18 දක්වා ලේඛන මගින් තහවුරු කර ඇත. 2017 සැප්තැම්බර් පැමිණීමේ ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමෙන් ද 2017 ඔක්තෝබර් නොවැම්බර් මාස වල ආදයම මුල් මාසවලට සාපේක්ෂව ලබා දී ඇති හෙයින් නිසි පරිදි සේවයට වාර්තා නොකිරීම නිසා කාර්ය සාධනය පහත වැටුනා යන්න වගඋත්තරකාර ආයතනයේ තර්කය පිළිගත නොහැකිය.

"As well as any other duties assigned to you by the Management of the company from time to time. A separate job Description detailing your duties and responsibilities of office will be issued to you upon commencement of employment (R1 ලිපියේ අවසාන ඡේදය)

නමුත් එවැන්නක් ඉල්ලුම්කරු වෙත දී නැත. ඉල්ලුම්කරුගේ සහ ආයතනයේ සාක්ෂි අනුව ඉලක්ක ගැන ලිඛිත දැනුවත් වීමක් සිදුවනුයේ 2017.11.21 දිනැති ඉල්ලුම්කරු අමතා ඇති R1 ලෙස ලකුණු කර ඇති ලිපියෙන් පමණි. මෙම ලිපියෙන් නොවැම්බර් මාසයට අදළ මිලියන 25 ක ආදයම කණ්ඩායම ලබා ගත යුතු යැයි දන්වා තිබෙන්නේ මාසය අවසානයේ ය. මෙවැනි ලිපියක් අතීත කාර්ය සාධනයට බලපෑම් කල නොහැකිය. අවවාදත්මක ලිපියක් යනු විනයානුකූල දඬුවමකි. එය දීමට පෙර වරදක් කර තිබේද එයට විනයානුකූලව කටයුතු කිරීමට පෙර නිදහසට කරුණු විමසා තිබීම සාධාරණ සහ යුක්ති සහගතය. නමුත් එවැනි ක්‍රියා මාර්ගයක් නොගැනීමෙන් ඉල්ලුම්කරුට අයුක්තියක් සිදුවේ. ඉල්ලුම්කරුගේ කාර්ය සාධනය සිදු වී නැද්ද විමසීමේදී ඉල්ලුම්කරු තම සේවා කාලය තුළ ඉපැයූ ආදයම් විමසිය යුතුය. ඉල්ලුම්කරු මෙම ලේඛන A10 සිට A18 දක්වා ලකුණු කර ඉදිරිපත් කර ඇත.
මේ අනුව,

| | | | | |
|---|---|---|---|---|
| 2017 | මාර්තු මස | මිලියන 11.37 | අප්‍රේල් | 13.5 |
| | මැයි මස | මිලියන 11.95 | ජුනි | 10.9 |
| | ජූලි මස | මිලියන 11.5 | අගෝස්තු | 13.8 |
| | සැප්තැම්බර් | මිලියන 12.2 | ඔක්තෝබර් | 9.5 |
| | නොවැම්බර් | මිලියන 11.6 | | |

2017 මාර්තු මස ආදයම මිලියන 10ක් ලෙස ආයතනය පිළිගෙන ඇත. පිටුව 361

මෙම ආදයම් විස්තරය ගැන වගඋත්තරකාර ආයතනය කිසිම හබ කිරීමක් කර නොමැති වීමෙන් හෙළි වූයේ ආදයම් පිළිගත්තා බවකි. මෙම තොරතුරු දෙපාර්තමේන්තුව වෙත විස්තර ඉදිරිපත් කිරීමේ දී ආයතනය වෙත යවා ඇත.

මූල්‍ය කළමණාකරු වගඋත්තරකාර ආයතනයේ මූලික සාක්ෂි වලදී කාර්ය සාධනයට අදල ඉලක්ක නිශ්චිතව දෙන බවට සාක්ෂි දී ඇත. පිටු අංක 278

ප්‍ර : සාක්ෂිකරු ඔබ වෙත පෙන්වා සිටින මේ R1 කියන ලේඛනයේ දෙවන ඡේදය සඳහන් වෙනවා (ඉංග්‍රීසියෙන් කියවා සිටි) සාක්ෂිකරු මොකද්ද ඒකෙන් සඳහන් වෙන්නේ.

පි : මෙහි සඳහන් වෙලා තියෙන්නේ ආයතනයේ කළමණාකාරීත්වය විසින් අයදුම්කරුට ඔහුගේ කණ්ඩායමටත් මෙම 2017 නොවැම්බර් මාසය සඳහා මිලියන 25 ක ඉලක්කයක් ලබා දී තිබෙනවා කියලා

ප්‍ර : දැන් ඔය මිලියන 25 ක ඉලක්කය කියන එකෙන් අදහස් කෙරෙන්නේ මොකද්ද?

පි : මිලියන 25 කියන එකෙන් අදහස් කරන්නේ ආයතනය සඳහා මාසික ආදයම මිලියන 25 ක ආදයමක් ඔහු සහ ඔහුගේ කණ්ඩායම විසින් රැගෙන ආ යුතුයි කියන එක.

නමුත් ඉල්ලුම්කරුගේ නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී සඳහන් කර ඇත්තේ ඒ පිළිබඳ දැනුවත් නැති බවය. 257 හා 258 පිටු

ප්‍ර : 2017 වර්ෂයේ මාර්තු මාසයේ සිට 2017 නොවැම්බර් දක්වා ඉල්ලුම්කරුට ලබා දී තිබූ ඉලක්ක සම්බන්ධයෙන් තමාගේ දැනුවත්භාවයක් නැති ද?

පි : දැනීමක් තිබෙනවා. නමුත් මට මේ වෙලාවේ ඒ ගැන කියන්න මතක නැහැ. මොකද මාසිකව එම ඉලක්ක වෙනස් වෙනවා.

ප්‍ර : 2017 වර්ෂයේ මාර්තු මාසයේ සිට 2017 වර්ෂයේ නොවැම්බර් මාසය දක්වා ඉල්ලුම්කරුට ලබා දී තිබූ මාසික ඉලක්ක ගැන දැනුවත් ද? නැද්ද ?

පි : මම දැනුවත්
ප්‍ර : ඒ මාසවල අදාල ඉලක්ක මොනවා ද කියලා වෙන වෙනම තමාට කියන්න පුළුවන් ද?
පි : මට මතක නැහැ

මේ අනුව ඉල්ලුම්කරුට මේ පිළිබඳව කිසිත් දැනුමක් නොමැතිව සාක්ෂි දී ඇත. ඉල්ලුම්කරුගේ කාර්ය සාධනය තහවුරු කිරීම සඳහා රතිකා මෙන්ඩිස් නැමැති අයගේ පත්වීම් ලිපිය ඉදිරිපත් කරයි. (ලිඛිත දේශන සමග ඉදිරිපත් කර නැත) එම අයට ද දීමනා ගෙවනු ලබන අතර කාර්ය සාධනයට අදල කොන්දේසි ඉදිරිපත් කර නැත. දෙපාර්ශවයේම සාක්ෂි සහ ලිඛිත දේශන විමර්ශන කිරීමේදී ආයතනයේ සාක්ෂිකරු ප්‍රකාශ කරන ඉලක්ක ආදයම් පිළිබඳ 2017 නොවැම්බර් 21 දිනැති R1 ලෙස ලකුණු කර ඇති ලිපියට පෙර ඉල්ලුම්කරුට හෝ කණ්ඩායමට ලිඛිත දැනුවත් කිරීමක් කළ බවට තහවුරු කර නැත. ආයතනයේ සාක්ෂිකරු ප්‍රකාශ කරන ඉලක්ක ගණනය කිරීම පෙර කාල සීමා හා සැලකීමේ දී ලඟා කර ගත නොහැකි ඉලක්කයකි. සෑම මසකම ඉලක්කය මිලියන 25 ක් බව ප්‍රකාශ කරයි. ආයතනයක ආදයම් ඉලක්ක ගණනය කිරීමට පෙර කාල සිමාවන් සහ කලින් සිටි සේවකයින්ගේ ඉලක්ක නොසලකා මෙවැනි ඉලක්කයක් ලබා දීම සාධාරණ නොවේ.

2017 මාර්තු සිට ලබා ඇති ආදයම් පිළිබඳ කිසිම හබ කිරීමක් කර නැති අතර 2017 මාර්තු ආදයම පිළිගෙන ඇත.
361 පිටුව

ප්‍ර : මේ තිබෙන්නේ ඉල්ලුම්කරු විසින් A10 ලෙස ලකුණු කල ලේඛන තමාගේ ආයතනයේ 2017 වර්ෂයේ මාර්තු මාසයට අදළ විකුණුම් වාර්තා පිළිබඳ ලේඛන කියලා තමා පිළිගන්නවාද?
පි : ඔව්

2017 මාර්තු සිට සැප්තැම්බර් දක්වා ඉල්ලුම්කරුගේ දීමනා වෙනස් වීමක් නොමැතිව ගෙවා ඇති අතර 2017 ඔක්තෝබර් ආදයම මිලියන 9.5ක්ද නොවැම්බර් ආදයම මිලියන 11.6 ක්ද වන අතර 2017.12 වැනි මස තවත් මිලියන 3 ක පමණ චෙක්පත් භාර දී ඇත. නමුත් මෙම ආදයම ගැන ඇගයීමක් කර නොමැත. පෙර මාසවලට සාපේක්ෂව මෙම මාස දෙකේ ආදයම් ලබා දී ඇති බැවින් දීමනා නැවැත්වීම අසාධාරණ ක්‍රියාවකි.

සමස්ථ සාක්ෂි සටහන් අනුව

* සාක්ෂිකරුගේ ප්‍රකාශය පරිදි A1b ලෙස ලකුණු කර ඇති මෙමරන්ඩම් නමින් දී ඇති ලිපියේ සඳහන් දීමනා පවරන රාජකාරී ඉටුකරන්නේ නම් පමණක් දෙන බවට ලිඛිත හෝ වාචිකව ඉල්ලුම්කරු හෝ කණ්ඩායම් දැනුවත්ව නොතිබීමෙන්ද,
* R1 ලෙස ලකුණු කළ පත්වීම් ලිපියේ Duties යන කොටස "Will be issue to you upon commence of employment ලෙස වුවද එවැන්නක් ලබා නොදීමෙන් ද,
* විනයානුකූල වරදක් වූ බවට චෝදනාවක් නොමැතිව R1 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති අවවාදත්මක ලිපියක් නිකුත් කිරීමෙන්ද ,
* මාසය අවසානයේ දෙන ලද ලියුමකින් අතීතයට බලපෑම් කිරීමට කටයුතු කිරීමෙන් ද,
* ලබා දිය නොහැකි අසාධාරණ ඉලක්කයක් ලබා දීමෙන් ද,
* කණ්ඩායම අන් අයගේ දීමනා පිළිබඳ එනම්, ගෙවනවා ද, ආදයම් අඩු වී නම් ගෙවීම් කර නැද්ද තහවුරු කර නොතිබීමෙන් ද,
* 2017 මාර්තු සිට සැප්තැම්බර් දක්වා ආදයම වෙනස් වුවත් දීමනා වෙනස් නොවීමෙන් ද,
* 2017 ඔක්තෝබර් මස හා නොවැම්බර් මස සේවයට නොපැමිණියානම් වැටුප් අඩු නොකිරීමෙන් ද,
* පැමිණීම් ලේඛන සැසදීම සඳහා අධිකරණයේ නියෝග මත වාර්තා ලබා නොදීමෙන් ද, යන හේතු මත වගඋත්තර ආයතනයේ ඉල්ලීම් වන ''ඉල්ලුම්කරුගේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන ලෙස ඉල්ලා සිටිමි.'' යන්න ප්‍රතික්ෂේප කරමි.

දෙපාර්ශවයේ සාක්ෂි සහ ලිඛිත දේශන සහ විස්තර ප්‍රකාශන අනුව A1 ලෙස ලකුණු කර ඉදිරපත් කර ඇති පත්වීම් ලිපිය සහ A1b ලෙස ඇමුණුමක් ලෙස මෙමරන්ඩම් නමින් දී ඇති ලේඛනයේ සඳහන් දීමනා නොගෙවීමට හේතුව ලෙස දක්වන ඉල්ලුම්කරුගේ කාර්යය සාධනය හා නිසි පරිදි සේවයට වාර්තා නොකිරීම යන හේතුව ප්‍රතිකෂේප කරමි.

ඉල්ලුම්කරුගේ සේවා කාලය 2017 මාර්තු සිට 2017 නොවැම්බර් 28 දක්වා බව වග උත්තකාර ආයතනය පිළිගෙන ඇත.

2019/11/05 දිනැති විස්තර ප්‍රකාශනයේ හා 2020/01/13 දිනැති පිළිතුරු ප්‍රකාශයේ හා R3 ලේඛන අනුව,

වොයිස් ඔෆ් ඒෂියා නේට්වර්ක් (ප්‍රයිවට් ලිමිටඩ්) ආයතනයේ සේවය කරන ලද උදය හේමේන්ද්‍ර සමරවීර මහතාට 2017 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලට අදලව දිරි දීමනා, වාහන දීමනාව, ඉන්ධන දීමනාව හා දුරකථන දීමනාව නොගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේද යන්නට පිළිතුර ඔව්.

එසේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද? යන්න පහත දක්වේ.

2017.03.01 සිට 2017 නොවැම්බර් 28 දක්වා සහ වොයිස් ඔෆ් ඒෂියා සමාගමේ අලෙවි ප්‍රධානි ලෙස සේවය කර ඇති උදය හේමේන්ද්‍ර සමරවීර මහතාට 2017 ඔක්තෝබර් මස නොගෙවන ලද රු. 399,975.00 ක් සහ නොවැම්බර් මස නොගෙවන ලද රු. 399,975.00 මුදලේ එකතුව වන රු. 799,950.00 ක මුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මෙම ප්‍රදනය පලවී මාසයක් ඇතුලත ඉල්ලුම්කරුට ලබා ගත හැකිවන පරිදි දකුණු කොළඹ කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බව නියෝග කරමි.

මෙම ප්‍රදනය සාධාරණ සහ යුක්ති සහගත බව සහතික කරමි.

**එච්. ආර්. එල්. සුගතදාස,**
බේරුම්කරු.

2022 සැප්තැම්බර් මස 07 වැනි දින.

EOG 10-0123

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.